**කොළඹ අගනගරය ආශ්‍රීත ජල ගැල්මෙන් පසු යථා තත්ත්වයට පත්වන නාගරික පරිසරය උදෙසා වූ භාර අරමුදල - 2016**

---

කොළඹ අගනගර ආශ්‍රිත ජල ගැල්මෙන් පසු යථා තත්ත්වයට පත්වන නාගරික පරිසරය උදෙසා වූ භාර අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ජාසංසං) අතර 2012 සැප්තැම්බර් 12 දින එළඹි අංක ටීඑෆ් 011617 දරන ප්‍රදාන ගිවිසුමේ සම්මත කොන්දේසි 2.07(ආ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 භාර අරමුදල ක්‍රියාත්මක කිරීම,අරමුණු,අරමුදල් යෙදවීම හා භාර අරමුදලේ කාලය

---

භාර අරමුදලේ ප්‍රදාන ගිවිසුම අනුව, එවකට ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය වර්තමානයේ මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය, භාර අරමුදල ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර භාර අරමුදල ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වන්නේ නාගරික සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරිමේ සංස්ථාව හා කොළඹ මහ නගර සභාවයි. ස්වාභාවික ආපදාවලින් පීඩාවට පත්වන ශ්‍රී ලංකාවේ නාගරික පරිසරය හඳුනාගැනීම, තක්සේරු කිරීම හා අඩුකිරීම සඳහා ශ්‍රී ලංකා රජයේ ධාරිතාවය ඉහල නැංවීම භාර අරමුදලේ අරමුණ වේ. ප්‍රදාන ගිවිසුම අනුව, භාර අරමුදලේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය වන රු.මිලියන 118.80 කට සමාන එජඩො 900,000 ක් සැපයීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟවී තිබුණි. භාර අරමුදල එහි කටයුතු 2012 සැප්තැම්බර් 12 දින ආරම්භ කරන ලද අතර 2014 ජුලි 30 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. භාර අරමුදලේ මෙහෙයුම් කාල පරිච්ඡේදය පසුව 2017 ජනවාරි 31 දක්වා දීර්ඝ කර තිබුණි. භාර අරමුදලේ මූල්‍ය ප්‍රතිඵල ඒකාබද්ධ කර 2014 දෙසැම්බර් 31 දක්වා කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත්කර තිබූ අතර ඉන්පසු 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ සිට ඉදිරියට භාර අරමුදල සඳහා වෙනම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වල අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස භාර අරමුදලේ

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් භාර අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුලත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල භාර අරමුදල කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ භාර අරමුදලේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව

(ආ) භාර අරමුදලේ මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන වියදම භාර අරමුදල විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳ තිබුණේද යන බව

(ඇ) ප්‍රදාන සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල් වලින් භාර අරමුදල විසින් දරන ලද වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් භාර අරමුදලේ ප්‍රගතිය, භාර අරමුදලේ මෙහෙයුම් කටයුතු වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ප්‍රදාන යටතේ මිලදී ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් භාර අරමුදල විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව්කර තිබුණේද යන බව සහ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය, එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) ප්‍රදාන යටතේ ආපසු ගැනීම් ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඊ) ප්‍රදන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ භාර අරමුදලේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) භාර අරමුදල ක්‍රියාත්මක කිරිම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයන්ට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඌ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(ඒ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූලව වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා භාර අරමුදල නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2016 දෙසැම්බර් 31 දිනට භාර අරමුදලේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් භාර අරමුදල විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ප්‍රදාන ගිවිසුමෙහි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

-------------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

-------------------------

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළ හා 2016 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන පහත දැක්වේ.

| ප්‍රභවය | ප්‍රදාන ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2016 දෙසැම්බර් 31 දින දක්වා | |
| | එ.ජ.ඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එ.ජ.ඩො මිලියන | රු. මිලියන | එ.ජ.ඩො මිලියන | රු. මිලියන |
| ජාසං.සං. | 0.90 | 118.80 | 80.00 | 0.16 | 23.01 | 0.25 | 35.44 |

ඉහත තොරතුරුවලට අනුව, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු ආරම්භ කර වර්ෂ 4 ක කාලයක් ගතවූ පසුවද, රු.මිලියන 118.80 කට සමාන එ.ජ.ඩොලර් 900,000 ක් වූ සමස්ථ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 35.44 කට සමාන එ.ජ.ඩොලර් 250,827 ක් පමණක් 2016 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කර තිබුණි.

**3.2** <u>භෞතික කාර්යසාධනය</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොළඹ අගනගරය ආශ්‍රිත ජලගැලීම් අවදානම තක්සේරු කිරීම, ජල ගැලීම් අවදානම අවම කිරීමේ උපායමාර්ග සකස් කිරීම හා නිර්දේශ ඉදිරිපත් කිරීම, තෙත් බිම් ප්‍රදේශ සංරක්ෂණය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කිරීම, වගුරු බිම්වල ජලයෙහි ගුණත්වය සහ පස් පරීක්ෂා කිරීම යනාදි භාර අරමුදලේ ප්‍රධාන කාර්යයන් සමාලෝචිත වර්ෂය අවසන් වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණද, එම කාර්යයන් නිමකර නොතිබුණි.

(ආ) මෙයට අමතරව, නියාමනය කිරීමේ හා ඇගයීමේ පද්ධතියක් සංවර්ධනය කිරීම තුළින් ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනවලට උපකාර කිරීමේ කටයුතු 2015 අගෝස්තු මාසය වනවිට අවසන් කිරීමට අපේක්ෂා කර තිබුණද, එම කටයුතු ආරම්භ කර නොතිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස, ව්‍යාපෘති කළමනාකරණය, ප්‍රසම්පාදන, මූල්‍ය පණිවුඩ හුවමාරුව, මහජනයා දැනුවත් කිරීම හා මෙහෙයවීම යන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනවලට උපකාර කළ හැකි තත්ත්වයට භාර අරමුදල පත්ව නොතිබුණි. මෙම නිසා, ස්වභාවික ව්‍යවසනවලින් නාගරික පරිසරයට වන පීඩාවන් අඩුකිරීම සඳහා වන භාර අරමුදලේ අරමුණු ලඟාකර ගැනීමේ අවදානම විගණනයේදී බැහැර කළ නොහැකි විය.

**3.3** <u>කොන්ත්‍රාත්තු පරිපාලනය</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අවිධිමත් ප්‍රසම්පාදන ක්‍රියාපිළිවෙල හේතුවෙන් ගංවතුර පාලනය කිරීමේ උපායමාර්ග නිර්දේශ කිරීම හා ඒ සඳහා ක්‍රියාකාරී සැලසුම් පිළියෙල කිරීමේ උපදේශක සේවා කොන්ත්‍රාත්තුව මාස 18 ක් පමා වී 2016 දෙසැම්බර් 31 දින ප්‍රදානය කර තිබුණි. මේ හේතුවෙන් කොන්ත්‍රාත්තුව නිම කිරීමේ කාලය තවදුරටත් 2017 ජනවාරි 31 දක්වා වර්ෂ 2 කින් දීර්ඝ කර තිබුණි.

(ආ) තෙත්බිම් සඳහා ප්‍රධාන සැලැස්මක් පිළියෙල කිරීම සහ කොළඹ නගරය ආශ්‍රිත පළාත තුළ ඇති අභ්‍යන්තර ජලමාර්ගවල සහ වැව්වල ජලයෙහි ගුණත්වය පිළිබඳ ඇගයීමක් කිරීම යන කාර්යයන් සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ජාත්‍යන්තර උපදේශක ආයතනවලින් ලංසු කැඳවා තිබුණි. ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මගින් සකස් කර තිබුණු උපදේශකයන් තෝරා ගැනීමේ නිර්නායකයන්ට පටහැනිව, සුදුසුකම් ලැබූ පළමු ආයතනයට අදාල කොන්ත්‍රාත්තුව ප්‍රදානය නොකර දෙවනුව සුදුසුකම්ලත් ආයතනය වෙත කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. මෙයට හේතුවූ කරුණු විගණනයට පැහැදිලි නොකෙරුණි.